## 465 ලේ කිරි කරලා

ලේ කිරි කරලා මට පෙව් අම්මා
මා ලෙඩ වූ විට නිදි මරමින් ළඟ ඉන්නා
මගේ විපතේදී මා අත් නොහරිනා
අනේ සමිඳුනී මගේ අම්මා රැකදේවා //

දහඩිය හෙළලා වෙහෙසක් නොබලා
මා වෙනුවෙන් ජීවිතයම පුදන තාත්තා
මගේ සැප පතා සැප අත් හරිනා
අනේ සමිඳුනේ මගේ තාත්තා රැකදේවා //

සුවපත් වේවා මව්පියෝ දෙදෙනා
ඔවුන් විඳින දුක හිරු දුටු පිණි මෙන් වේවා
විඳ නිම නොවෙනා සැපත ලබන්ටා
අනේ සමිඳුනේ මගෙ මව්පියෝ රැකදේවා //